# 2026

# වාර්ෂික අයවැය


















**DIMBULAGALA PRADESHIYA SABHA**
**MANAMPITIYA**
**POLONNARUWA**

# අපගේ අභිමානය

බල ප්‍රදේශයේ සෑම පුරවැසියෙකුගේම අපේක්ෂාවන් සහ හැකියාවන් පිළිබඳව අප විශ්වාසය තබන අතර, ඔවුන්ගේ සිහින සැබෑ කරවීම සඳහා ඔවුන් සවිබල ගැන්වීමට හැකියාව ලැබීම අපගේ අභිමානයයි.

ජනතාවගේ සුබ විහරණය හා සුභසාධනය නඟා සිටුවමින් පළාත් පාලන අවකාශය තුළ විශිෂ්ටත්වය හඹායාම සඳහා අපව පොළඹවන සහ මෙහෙයවන අභිමානය මෙයයි.

අප මූල්‍යමය හා භෞතික සම්පත්වලින් පරිපූර්ණ හා ශක්තිමත් වූ දක්ෂ, දූරදර්ශී සහ කැපවීමෙන් ක්‍රියාකරන අස්ථිත්වයක් වශයෙන් අපගේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම පිණිස නිරන්තර කැපවී සිටින්නෙමු.

අපගේ ගමන දිරිමත්ය.

අපගේ ගමන ජව සම්පන්නය.

# අන්තර්ගතය

**01.** **පූර්විකාව**

| | | |
|---|---|---|
| 1.1 | පළාත් පාලන උරුමය හා එහි විකාශය | 01 |
| 1.2 | අපගේ දැක්ම හා මෙහෙවර | 02 |
| 1.3 | අපගේ කාර්යයන් හා වගකීම් | 03-04 |
| 1.4 | සම්බන්ධීකරණ තොරතුරු | 05 |
| 1.5 | බල ප්‍රදේශය හඳුනාගැනීම | 06 |
| 1.6 | පොදු තොරතුරු | 07-08 |
| 1.7 | හැඳින්වීම හා අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය | 09-12 |

**02.** **නායකත්වය**

| | | |
|---|---|---|
| 2.1 | සභාපතිවරයාගේ පණිවිඩය | 13-14 |
| 2.2 | ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය | 15-16 |

**03.** **පාලනය**

| | | |
|---|---|---|
| 3.1 | පරිපාලනය | 17-19 |
| 3.2 | ආයතනික පාලන ප්‍රකාශය හා කමිටු | 20-23 |

**04.** **මූල්‍ය තොරතුරු**

| | | |
|---|---|---|
| 4.1 | ආර්ථික අගයන් පිලිබඳ විශ්ලේෂණය | 24 |
| 4.2 | අයවැය සාරාංශය | 25 |
| 4.3 | අත්තිකාරම් ගිණුම් හා ප්‍රාග්ධන ප්‍රදාන සාරාංශය | 26 |
| 4.4 | ඇස්තමේන්තුගත ආදායම් සාරාංශය | 27 |
| 4.5 | ඇස්තමේන්තුගත වියදම් සාරාංශය | 28 |

**05.** **විස්තරාත්මක තොරතුරු**

**01.** **පොදු පරිපාලනය**

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 29-32 |
| 1.2 | ආදායම් ඇස්තමේන්තුව | 33 |
| 1.3 | වියදම් ඇස්තමේන්තුව | 34-35 |

**03.** **සෞඛ්‍ය සේවා**

| | | |
|---|---|---|
| 3.1 | හැඳින්වීම | 36-38 |
| 3.2 | ආදායම් ඇස්තමේන්තුව | 39 |
| 3.3 | වියදම් ඇස්තමේන්තුව | 40 |

**04.** **භෞතික සැලසුම්**

| | | |
|---|---|---|
| 4.1 | හැඳින්වීම | 41-42 |
| 4.2 | ආදායම් ඇස්තමේන්තුව | 43 |
| 4.3 | වියදම් ඇස්තමේන්තුව | 44 |

**05.** **ජල සේවා**

| | | |
|---|---|---|
| 5.1 | හැඳින්වීම | 45-46 |
| 5.2 | ආදායම් ඇස්තමේන්තුව | 47 |
| 5.3 | වියදම් ඇස්තමේන්තුව | 48 |

**06.** **මහජන උපයෝගිතා**

| | | |
|---|---|---|
| 6.1 | හැඳින්වීම | 49-50 |
| 6.2 | ආදායම් ඇස්තමේන්තුව | 51 |
| 6.3 | වියදම් ඇස්තමේන්තුව | 52 |

**07.** **සුභසාධක සේවා**

| | | |
|---|---|---|
| 7.1 | හැඳින්වීම | 53-54 |
| 7.2 | ආදායම් ඇස්තමේන්තුව | 55 |
| 7.3 | වියදම් ඇස්තමේන්තුව | 56 |

**06.** **ප්‍රාග්ධන ප්‍රමුඛතා ලැයිස්තුව** 57

## පළාත් පාලන උරුමය හා එහි විකාශය

වර්තමානයේ මෙරට පවත්නා පළාත් පාලන ආයතන ක්‍රමය ආගන්තුක සංකල්පයක් නොවේ. වසර 2500 ක් තරම් ඈතට දිවෙන අපේ සමාජ අර්ථක්‍රම, සාරධර්ම හා පොදුජන ජීවිතය හා බැඳුනු ආයතන රාමුවක විකාශනයකි.

ඈත අතීතයෙහි ක්‍රිස්තු පූර්ව 4 වන සියවසෙහි පණ්ඩුකාභය රජතුමාගේ කාලයෙහි අනුරාධපුර නගරය පිහිටුවීමේදී පළාත් පාලන ක්‍රමයක් පැවති බව සඳහන් වේ. ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ තඹගල්ල සෙල්ලිපියද, 10 වන සියවසේ තුන්වන උදය රජු පිහිටවූ බදුලු ටැම් ලිපියද, වේවැල් කැටිය සෙල් ලිපියද පැරණි පැවති ගම්සභා සහ නාගරික පාලන ක්‍රම පිළිබඳ තොරතුරු සපයයි.

මහනුවර සහ කෝට්ටේ රාජධානි සමයෙහිද ගම් සභාව ජන සම්මතවාදී සංවිධානයක් ලෙස පැවති බවට රාජසිංහ රජුගේ මල්වාන ගිවිසුමද, රොබට් නොක්ස්ගේ ලංකාව ගැන ලියූ ග්‍රන්ථයද සනාථ කරයි.

1815 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ලංකාව යටත්වූ පසු 1818 දී පැරණි ගම්සභා ක්‍රමය අහෝසි කළ නමුත් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ඇලවේලි හා වාරිමාර්ග පරිපාලනයට 1856 දී ගම්සභාව නැවත පිහිටුවන ලදි. 1871 දී වැඩි බලතල සහිත නව ගම්සභා ක්‍රමයක් ඇති කරන ලදි. 1980 සංවර්ධන සභා පිහිටුවන තුරුම ක්‍රියාත්මක වූ පැරණි ගම් සභාව සංවර්ධන සභා අහෝසිවීමෙන් පසුව 1987 දී ප්‍රාදේශීය සභා නමින් නැවත වැඩි බලතල පිහිටුවා තිබේ.

1865 වර්ෂයේදී විශාල නගර සඳහා මහ නගර සභා පිහිටුවන ලදි. සංශෝධන ගණනකාවකට ලක්වී අද පවත්නා මහ නගර සභා 1987 අංක 16 දරන ආඥාපනත යටතේ පිහිටුවා ඇත. 19 වන සියවසේ මැද භාගයේදී රට තුළ මධ්‍යම පරිමාණයේ නගර පද්ධතියක් බිහිවූ අතර, ඒවා පාලනය සඳහා 1892 දී සෞඛ්‍ය මණ්ඩලය නම්වූ ආයතනයක් ඇති කළ අතර, 1920 දී එය පළාත් ආණ්ඩු සභා බවට පරිවර්තනය කරන ලදි. 1929 අංක 61 දරන ආඥාපනත මඟින් පළාත් ආණ්ඩු සභා වෙනුවට අද පවතින නගර සභා ඇති කරන ලදි.

1987 දී පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් පළාත් සභා මෙරට ඇති කරන ලදි. පළාත් සභා සංස්ථාපනය කිරීමත් සමඟ මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පරිපාලනය හා අධීක්ෂණය පළාත් සභා වලට පවරන ලදි. ඒ සමඟම එයට පෙර පැවති සංවර්ධන සභා අහෝසිකර ප්‍රාදේශීය සභා පිහිටුවීමටද, පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් තේරීමේ කොට්ඨාශ ක්‍රමය වෙනුවට අනුපාත ඡන්ද ක්‍රමය හඳුන්වාදීම ද 87/88 කාලයේදී සිදුකරන ලදි.

## දැක්ම

ජනතාවට වඩා කාර්යක්ෂම ඵලදායි සේවාවන් සැපයීමත්, ජනතාවගේ සහයෝගය ලබාගනිමින් විනිවිදභාවයකින් කටයුතු කිරීමත් අපගේ දැක්ම වේ.

## මෙහෙවර

සුවපහසු ජීවිතයක් සඳහා වූ ජනතා අපේක්ෂාවන් සඵලකර දෙනු වස් අප සතු වගකීම් විනිවිදභාවයකින් යුතුව ජනතා සහභාගිත්වය සහිතව පවතින සම්පත් නිසිලෙස කළමනාකරණය කරමින් සීමා අතික්‍රමණය නොවන පරිදි ජනතා සුභසාධනය, සුවපහසුව හා සුබ විහරණය සාධනීය ලෙස ඉටු කරදීම අප විසින් ප්‍රතිඥාදීම.



# අපගේ කාර්යයන්

- දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තිරසර සංවර්ධනය වඩා වේගවත් කොට ජනතාවට වගකිව යුතු ආයතනයක් බවට පත්කිරීම.
- මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, පොදු මංමාවත් සංවර්ධනය හා ප්‍රදේශයේ ජනතාවගේ සුබවිහරණය, පහසුව සහ සුභසාධනය සැලසීම.
- මහජනතාවගේ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාල සියලු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම.
- සීමිත සම්පත් ප්‍රමාණයක් නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් නෛතික රාමුව අතික්‍රමණය නොකරමින් කාර්යක්ෂම සේවයක් සිදුකිරීම.
- පරිසරය ආරක්ෂා කිරීම සහ ඝණඅපද්‍රව්‍ය බැහැර කිරීම ක්‍රමවත් වැඩපිළිවෙළකට අනුගත වෙමින් සිදුකිරීම.
- ස්වයං උත්පාදන ආදායම් මාර්ග වර්ධනය කිරීම හා උපයා ගත හැකි සියලු ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම.
- කිසිදු භේදයකින් තොරව ප්‍රදේශයේ සියලු ජන කොටස් වලට සේවා හා පොදු පහසුකම් බෙදී යන ආකාරයට කටයුතු කිරීම.
- මූල්‍ය විනය පවත්වා ගැනීම.

## අපගේ වගකීම්

තනි තනිව පුද්ගලයින්ට හෝ කණ්ඩායමකට සපුරාගත නොහැකි පොදු ජන ජීවිතය සුවදායී සහ පහසු කරන්නා වූ වගකීම් සමූහයක් දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී තිබේ. මෙම වගකීම් ප්‍රධාන කරුණු 06ක් යටතේ පහත සඳහන් පරිදි දැක්වේ.

**01. මහජන සෞඛ්‍යය හා පාරිසරික සේවා**

**02. මංමාවත්**

- ❖ ජලාපවාහනය - ජලාපවාහන කාණු, ජල මාර්ග ඇති කිරීම, පවත්වාගෙන යාම හා විධිමත් ලෙස නඩත්තු කිරීම.
- ❖ මළාපවාහනය - පදිංචි නිවාස, ගොඩනැඟිලි හා පොදු ස්ථානවල වැසිකිළි, කැසිකිළි ප්‍රමාණවත් බව හා සනීපාරක්ෂක ලෙස පවත්වාගෙන යාම පිළිබඳව විධිවිධාන යෙදීම.
- ❖ කසළ කළමනාකරණය - වීදි හා මාර්ග පිරිසිදු කිරීම, කසළ එකතුකිරීම, නිවෙස්ගත හා පොදු ස්ථානවලින් බැහැර කරන ඝන අපද්‍රව්‍ය ප්‍රවාහනය සහ කසළ බැහැරලන ස්ථාන නඩත්තුව හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම.
- ❖ සෞඛ්‍ය සම්පන්න නොවූ ගොඩනැඟීම් පාලනය කිරීම - අධික තදබදය මඟහැරීම, රෝග පැතිරීමට ඇති ඉඩකඩ නැති කිරීම.
- ❖ පීඩා පාලනය - ශබ්ද, වායු හා වෙනත් පාරිසරික මහජන පීඩා මඟහැරවීම.
- ❖ ආහාරවල සනීපාරක්ෂකභාවය - නිෂ්පාදන අලෙවිය හා පාරිභෝජනය කරන ස්ථානවල කටයුතු විධිමත් කිරීම සහ ආහාරපාන පරීක්ෂාව
- ❖ මාතෘ හා ළමා සෞඛ්‍යය - සායන පැවැත්වීම, බෙහෙත්ශාලා, ප්‍රතිකාර මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

**03. මහජන උපයෝගී සේවා**

- ❖ පානීය ජල සම්පාදනය
- ❖ පොදු ස්ථාන, ගොඩනැඟිලි හා වීදි අලෝකමත් කිරීම.
- ❖ වෙළඳපොළවල්, සතිපොලවල් හා අලෙවිසැල් ඇති කිරීම.
- ❖ පොදු නාන ස්ථාන හා නාන තොටුපළවල් ඇති කිරීම.
- ❖ සුසානභූමි, ආදාහනාගාර පවත්වාගෙන යාම.
- ❖ ක්‍රීඩාංගන, ක්‍රීඩා භූමි, ප්‍රජාශාලා හා ප්‍රජා මධ්‍යස්ථාන ඇති කිරීම.
- ❖ විනෝද පහසුකම් සැලසීම.

**04. අධ්‍යාපන සේවා**

**05. සමාජ සුභසාධනය**

**06. සමාජ සංවර්ධනය**

## සම්බන්ධීකරණ තොරතුරු

| | | | |
|---|---|---|---|
| ලිපිනය | :- | දිඹුලාගල ප්‍රාදේශීය සභාව, මනම්පිටිය | |
| විද්‍යුත් ලිපිනය | :- | psdimbulagala@gmail.com | |
| වෙබ් අඩවිය | :- | https://dimbulagala.ps.gov.lk | |
| Facebook | : - | Dimbulagala Pradeshiya Sabha | |
| WhatsApp | : - | 070 4051002 | |
| ෆැක්ස් | :- | 027 2051002 | |
| දුරකථන අංක | :- | ගරු සභාපතිතුමා | 027 2057511 |
| | | ලේකම්තුමා | 027 2057512 |
| | | කාර්යාලය | 027 2051002 |

# බල ප්‍රදේශය හඳුනාගැනීම









# සංඛ්‍යාත්මක තොරතුරු

## 01. ආයතනික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | දිඹුලාගල ප්‍රාදේශීය සභාව |
| 2. | ලිපිනය | :- | මනම්පිටිය, පොළොන්නරුව |
| 3. | පළාත | :- | උතුරු මැද පළාත |
| 4. | පරිපාලන දිස්ත්‍රික්කය | :- | පොළොන්නරුව |
| 5. | දුරකථන අංකය | :- | 027 2051002 |
| 6. | විද්‍යුත් තැපැල | :- | psdimbulagala@gmail.com |
| 7. | වෙබ් අඩවිය | :- | https://dimbulagala.ps.gov.lk |
| 8. | බල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් | :- | 581 |
| 9. | ජනගහනය | :- | 100110<br>පිරිමි - 52057<br>ස්ත්‍රී - 48053 |
| 10. | ග්‍රාම නිලධාරි වසම් | :- | 56 |
| 11. | ආයුර්වේද බෙහෙත් ශාලා | :- | 01 |

## 02. මාර්ග හා වීථි ලාම්පු පිළිබඳ තොරතුරු

1. කොන්ක්‍රීට් / කුට්ටිගල් ඇතිරූ මාර්ග - කි.මී. 62.6
2. බොරළු ඇතිරූ මාර්ග - කි.මී. 203

## 03. සේවක තොරතුරු - පිටු අංක හි දක්වා ඇත.

## 04. ආයතනය සතු ඉඩම් හා ගොඩනැඟිලි තොරතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | කඩ කාමර සංඛ්‍යාව | - | 16 | 7. | ක්‍රීඩා භූමි සංඛ්‍යාව | - | 67 |
| 2. | සුසාන භූමි සංඛ්‍යාව | - | 62 | 8. | පොදු වැසිකිලි සංඛ්‍යාව | - | 02 |
| 3. | පුස්තකාල සංඛ්‍යාව | - | 01 | 9. | සති පොළවල් සංඛ්‍යාව | - | 06 |
| 4. | ජල ව්‍යාපෘති සංඛ්‍යාව | - | 04 | 10. | නිල නිවාස සංඛ්‍යාව | - | 01 |
| 5. | පෙර පාසැල් සංඛ්‍යාව | - | 03 | 11. | ප්‍රජා ශාලා සංඛ්‍යාව | - | 05 |
| 6. | ආදාහනාගාර | - | 01 | 12. | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | - | 01 |

## 05. ප්‍රාදේශීය සභාව සතු වාහන සංඛ්‍යාව

සභාව සතු වාහන සංඛ්‍යාව - 34

| වාහනවර්ගය | ප්‍රමාණය |
|---|---|
| ත්‍රී රෝද රථය | 3 |
| මෝටර් ලොරි | 3 |
| මෝටර් ග්‍රේඩර් | 1 |
| කැබ් රථ | 2 |
| යතුරු පැදි | 8 |
| බැකෝ ලෝඩර් | 1 |
| ගාබේජ් කම්පැක්ටර් | 1 |
| ගලි බවුසර | 1 |
| ජල බවුසර | 4 |
| අත් ට්‍රැක්ටර් | 1 |
| ට්‍රැක්ටර | 5 |
| ට්‍රැක්ටර් ටේලර් | 3 |
| ගල් රෝල | 1 |
| **එකතුව** | **29** |

## අයවැය පූර්විකාව

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ තිරසර සංවර්ධනය සඳහා සකස්කරන ලද අයවැය මහජනතාව වෙත ඉදිරිපත් කරන්නට ලැබීම දිඹුලාගල ප්‍රාදේශීය සභාවට ඉමහත් ආඩම්බරයක් වන අතර, එය සැබවින්ම ජනතාවගේ සුබ විහරණය, සුභසාධනය හා තිරසර සංවර්ධනය ඉලක්ක කරගත් අයවැයද වේ.
ශක්තිමත් හා මනා ප්‍රතිචාරයක් ඇති මහජන මූල්‍ය කළමනාකරණයක් සිදුකිරීම සඳහා පාරදෘෂ්‍යභාවය, වගවීම සහ ජනතා සහභාගිත්වය ඉතාම වැදගත්වන මූලික අංගයක් වේ. සැබවින්ම ජනතාව සඳහා වන අයවැයක් නිර්මාණය කරමින් බල ප්‍රදේශයේ සංවර්ධනය ඇති කිරීම සඳහා කටයුතු කිරීමට දිඹුලාගල ප්‍රාදේශීය සභාව කැප වී සිටියි.

අපගේ ශ්‍රේෂ්ඨ වූ බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ අවශ්‍යතාවයන් මෙම අයවැය මඟින් සපුරාලනු ලබන බව තහවුරු කිරීම සඳහා, උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ගේ ලබාගත් තොරතුරු හා දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව තාත්වික අයවැයක් සකස්කිරීමට හැකි වූ බව සඳහන් කළ හැක.

මහජනතාව දිඹුලාගල ප්‍රාදේශීය සභාවෙන් සේවාවන් ලබාගැනීම වෙනුවෙන් ඔවුන් විසින් සාධාරණ අගය ගෙවීම මඟින් දිඹුලාගල ප්‍රාදේශීය සභාව වෙත මූල්‍ය සම්පාදනය කිරීමට දායකවීමේ වගකීම පුරවැසියන් සතුවන අතරම, තම දායක මුදල් වියදම් කරනු ලබන ආකාරය කවරේද යන්න දැනගැනීමේ අයිතියද ඔවුන් සතුය. දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ අයවැය තොරතුරු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක. 2182/39 නියමයන්ට අනුව හා 2019.12.31 දිනැති නිකුත් කරන ලද පළාත් පාලන චක්‍රලේඛ අංක. 2019/02 හි සඳහන් ආකෘතිපත්‍ර භාවිතයෙන් සංක්ෂිප්ත ආකාරයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍යමය යාන්ත්‍රණයන් සැපයීම පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් පුරවැසියා වෙත ලබාදීම මෙහි අරමුණයි.

බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සකස්කරනු ලබන අයවැය ක්‍රියාවලියට සක්‍රීයව සහභාගිවීමට සහ ප්‍රබල හා කාර්යක්ෂම ආකාරයෙන් ශ්‍රම දායකත්වයක් ලබාදීමටද මෙමඟින් බලාපොරොත්තු වන අතර, ඒ තුළින් ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට දිඹුලාගල ප්‍රාදේශීය සභාවට හැකිවනු ඇත.

දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පුනර්ජීවනය කර එහි ජීවත්වන සියළු පාර්ශවයන් සඳහා සෞභාග්‍යමත් හා සාධාරණ සමාජයක් ගොඩනැඟීම සඳහා අප සාමූහිකව එක්වී කටයුතු කරමු.

## 2026 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම

## පිළිබඳව ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වගන්තියට අනුව 2023 වර්ෂය සඳහා සැපයුම්, වැඩ හා සේවාවන් සැපයුමට අවශ්‍ය ප්‍රතිපාදන සළසාදීම මෙම අයවැයේ අරමුණ වේ.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වගන්තිය යටතේ සඳහන් කර ඇති නියමයන්ට යටත්ව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 2182/39 හි ඇතුළත් නියමයන්ට අනුව මෙම අයවැය ලේඛණය පිළියෙල කර ඇති අතර, ප්‍රාදේශීය සභා සභාපති වෙත පැවරී ඇති බලතල අනුව 2025 නොවැම්බර් මස 24 වන දින 2026 අයවැය වාර්තාව මහසභාව වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

2026 අයවැය සම්පාදනය කිරීමෙහිලා දිඹුලාගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අභිවෘද්ධිය අපේක්ෂා කරන මහජන නියෝජිතයින්ගෙන් හා අනෙකුත් පාර්ශවයන්ගෙන් හා සමීක්ෂණ වාර්ථා පදනම් කරගෙන අදහස් හා යෝජනා හැකිතාක් දුරට ලබා ගනිමින් මෙම අයවැය ලේඛනය සකස් කිරීමට කටයුතු කරන ලදී. එම සමීක්ෂණයන්ට අනුව පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හැකියාව ලැබී ඇත.

- ✓ ප්‍රජාව තුළ බෝවන හා බෝනොවන රෝග පාලනය
- ✓ බෝක්කු හා මංමාවත් සංවර්ධනය
- ✓ පානීය ජල සම්පාදනය
- ✓ වීථි ආලෝකකරණය
- ✓ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ✓ මළ අපද්‍රව්‍ය පිරිපහදුකරණය
- ✓ ව්‍යවසායකත්ව සංවර්ධනය
- ✓ දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ✓ ආදායම් උත්පාදනය කිරීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා පවතින ව්‍යාපෘති සංවර්ධනය කිරීම.
- ✓ ප්‍රජා සංවර්ධන කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා නව වැඩසටහන් ඇතුළත් කිරීම.
- ✓ ප්‍රදේශයේ ජනතාවගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම සඳහා පුස්තකාල සංවර්ධනයට අවධානය යොමු කිරීම.
- ✓ සමාජ ආරක්ෂණය
- ✓ රාජ්‍ය මූල්‍ය කටයුතුවලට අදාළ ඩිජිටල් ප්‍රතිසංස්කරණ
- ✓ තරුණ, ළමා හා කාන්තා කටයුතු සඳහා මුදල් වෙන්කිරීම
- ✓ පාරිසරික කළමනාකරණය
- ✓ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම

අයවැය තුළ ඇතුළත්ව ඇති ආදායම් හා වියදම් උතුරුමැද පළාත් පාලන චක්‍රලේඛ අංක 2019/02 හි සඳහන් පරිදි වැඩසටහන් හා ව්‍යාපෘතීන්ට අදාලව වර්ගීකරණය කර සාරාංශගතව ඉදිරිපත් කර ඇත. අය ශීර්ෂ පුනරාවර්ථන ආදායම් හා පුනරාවර්ථන නොවන වියදම් සඳහා ලැබීම් වලින් සමන්විත වන අතර, වැය ශීර්ෂ පුනරාවර්ථන වියදම් හා පුනරාවර්ථන නොවන වියදම් වලින් සමන්විත වේ.

## ආදායම් ඇස්තමේන්තු බෙදී ඇති ආකාරය

ප්‍රාදේශීය සභා පනතේ නියමයන්ට හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්පත්‍ර අංක 2182/39 හි ඇතුළත් නියමයන්ට අනුව පහතින් දක්වා ඇති ආදායම් ශීර්ෂයන්ට අදාලව ආදායම් වර්ගීකරණය කර ඇත.

4100. වරිපනම් හා බදු

4200. කුලී

4300. බලපත්‍ර ගාස්තු

4400. සේවා ගාස්තු

4500. වරෙන්තු, දඩ හා අධිභාර

4600. වෙනත් විකුණුම් ආදායම්

4700. පොලී ආදායම්

4800. විවිධ ආදායම්

4900. ව්‍යාපෘති ආදායම්

5100. ප්‍රදාන - පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්

5200. විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා ප්‍රාග්ධන ප්‍රදාන

## වියදම් ඇස්තමේන්තු බෙදී ඇති ආකාරය

ප්‍රාදේශීය සභා පනතේ නියමයන්ට හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 2182/39 හි ඇතුළත් නියමයන්ට අනුව පහතින් දක්වා ඇති වියදම් ශීර්ෂයන්ට අදාලව වියදම් වර්ගීකරණය කර ඇත.

1000. වැටුප් හා දීමනා

1100. ගමන් ගාස්තු

1200. සැපයුම්

1300. අළුත්වැඩියා හා නඩත්තු

1400. පරිපාලන වියදම්

1500. සුභසාධන ගෙවීම්

1600. විවිධ ගෙවීම්

1700. වෙනත්

1800. ක්ෂය කිරීම

1850. ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත අලාභ

1900. මූල්‍ය පිරිවැය

## ගරු සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ ඓතිහාසික පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංස්ථාපිත දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මාගේ ධූර කාලයේ පළමුවන අයවැය මෙම ගරු මහ සභාව වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටක් මෙන්ම මා ලද භාග්‍යයකි.

විවිධ මූලාශ්‍රයන්ගෙන් හා ස්වයං උත්පාදන ආදායමෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් සංවර්ධන ව්‍යාපෘති රැසක් 2025 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපට හැකි විය. එහිදී යටිතල පහසුකම් සංවර්ධනය, සමාජ සුභසාධනය, සමාජ ආරක්ෂණය යන අංශයන් කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් සංවර්ධන කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත්, ඒවායේ ප්‍රතිඵල හා ප්‍රතිලාභ මහජනතාවට වඩාත් සමීප කිරීමටත් හැකිවීම දිඹුලාගල ප්‍රාදේශීය සභාව ලද ජයග්‍රහණයකි.

ප්‍රාදේශීය සභාවේ දැක්ම ළඟාකර ගැනීම සඳහා සකස් කර ක්‍රියාත්මක කරන ලද සැලසුම්, වැඩසටහන්, ව්‍යාපෘති, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන් (තිරසර සංවර්ධන අභිමතාර්ථ) ද සැළකිල්ලට ගනිමින් ඉදිරි වර්ෂය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. තවද රජයේ මූලික වැඩසටහන් වන රාජ්‍ය මූල්‍ය ඩිජිටල්කරණ, ග්‍රාමීය දුප්පත්කම තුරන්කිරීම හා Clean Sri Lanka වැනි වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම තුළින් තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් කරා ගෙන යාම 2026 අයවැය තුළින් අපේක්ෂා කෙරේ.

විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සමාජ ආරක්ෂණ සේවා, ග්‍රාමීය යටිතල පහසුකම්, ග්‍රාම සංවර්ධනය හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය යන අංශයන්ගේ සංවර්ධන කටයුතු ද, ප්‍රාදේශීය සභා මාර්ග පද්ධතිය තුළ අවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු ග්‍රාමීය මාර්ග පද්ධතිය තුළ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කිරීමටත්, දිඹුලාගල ප්‍රාදේශීය සභා ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමටත්, අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැලකිය යුතු මට්ටමකින් සංවර්ධනය කිරිමටත්, බල ප්‍රදේශයේ ජනතාවට ප්‍රබල අභියෝගයක්ව පැවැති පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සඳහා පානීය ජල ව්‍යාපෘති සංවර්ධනය කරමින් බල ප්‍රදේශයේ ප්‍රමුඛ ගැටළුවලට යම් සාධනීය මට්ටමකින් සම්බන්ධවීමටත් ඉදිරි වසර සැලසුම් කර ඇත.

ප්‍රධාන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක එපමණක් නොව ප්‍රාදේශීය සභා අරමුදල් හා රජයේ කිරීමට මෙන්ම සමස්ත සංවර්ධන වැඩසටහන නියාමනය හා ඇගයුම් කරමින් සංවර්ධනාත්මක දිශානතියකට යොමු කිරීමටත්, මූල්‍ය විනය විධිමත්ව පවත්වා ගනිමින් අභ්‍යන්තර පාලන පරික්ෂාවන් ශක්තිමත් කිරීමටත් ඒ තුළින් පවතින ගැටළු නිරවුල් කරගැනීම තුළින් ප්‍රශස්ථ වර්ධනයක් ඇතිකිරීමට 2026 වසර තුළ අපේක්ෂා කරමි.

ඉදිරිය වෙත අප යන ගමනේදී, අඛණ්ඩ පැවැත්මක් සහිතව බල ප්‍රදේශයේ ජනතාව සඳහා අති විශිෂ්ට වූ අත්දැකීම් නිර්මාණය කරමින්, ජනතාවට සේවය සැලසීම ඒකායන ප්‍රමුඛතාවය බවට පත්කර ගනිමින්, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ යුග මෙහෙවර අනාගතය වෙත රැගෙන යාම අපගේ අති මහත් වූ අභිප්‍රාය වේ. එහිදී සේවා සැපයුම් වශයෙන්ද, නිෂ්පාදන වශයෙන්ද නවෝත්පාදනයන් බිහි කරමින්, සවිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක සහාය ඇතිව වඩාත් සරල වූද, තිරසර අස්තිත්වයක් බිහිකිරීම මාගේ අරමුණ වේ.

වැදගත්ම කරුණ නම්, තෘප්තිමත් සේවාලාභී ජනතාවක් ඇති කිරීම උදෙසා අද දිනයේදීත්, හෙට දිනයේදීත් එමෙන්ම ඉදිරි අනාගතයේදීත් උතුරු මැද පළාතේ අතිශය ප්‍රමුඛතම පළාත් පාලන ආයතනය බවට පත් කිරීම අපගේ අභිප්‍රායයි.

මේ ඔබට ඉදිරිපත් කරනු ලබන්නේ එවන් සුවිශේෂී කාර්යයන් රැසක වගකීම දරනු ලබන දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් ඇතුළත් අයවැය වාර්තාවයි. අප ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂයේදී අයකර ගැනීමට අපේක්ෂිත ආදායම් හා වියදම් මෙන්ම ඉදිරි සැලසුම් පිළිබඳව මෙහි සංක්ෂිප්තව සටහන් කර ඇත.

සිංහල හා දෙමළ සම්මිශ්‍රණ ජනතාවක් වෙසෙන දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජාතීන් අතර සහයෝගිතාව වඩ වඩාත් වර්ධනය කර ගනිමින්, සියළු කාර්යයන්ට බද්ධ වන රාජ්‍ය ආයතන අතර, මනා සහයෝගයක් හා සම්බන්ධීකරණයක් ගොඩනඟා ගනිමින් ඉහළ ජනතා සේවයක් ඉටු කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි පතන අතර, අපි ආර්ථික වශයෙන් සමෘද්ධිමත් පමණක් නොව සදාචාරාත්මකව ආඩම්බර වන, ගෝලීය වශයෙන් ගෞරවයට පාත්‍ර වූ සහ පුළුල් මානුෂීය ගුණාංගවලින් හෙබි ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැඟීම සඳහා වන අවශ්‍ය දායකත්වය අප පළාත් පාලන ආයතනය විසින් 2026 වර්ෂයේදී ලබාදීමට හැකි වර්ෂයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

කේ.ආර්.ගයාන් චතුරංග,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

# ප්‍රධාන විධායක නිළධාරියාගේ සමාලෝචනය



ව්‍යවස්ථානුකූල පරිණාමය අනාගතය දෙස විමසා බැලීමේදී හා සියලූ පාර්ශවකරුවන් හට ප්‍රතිලාභ සැලසීමේදී තාක්ෂණික යුගය කරා පරිවර්තනය වීම අනිවාර්යෙන්ම සිදුවිය යුත්තකි. පෙර වසරවලට සාපේක්ෂව 2025 වසරේදී මෙන්ම ඉදිරි වසරේ දී තාක්ෂණික පදනම් වෙත ශ්‍රී ලංකාව යොමු වූ බව පෙනීයයි. එමෙන්ම සේවාලාභීන්ද සිය සේවාවන් ලබා ගැනීමේ දී වැඩි වැඩියෙන් තාක්ෂණික සේවාවන් වෙත යොමුව තිබෙනු දක්නට හැකි විය.

අප විසින් සැබෑ ආර්ථික වර්ධනය අත්කර ගැනීම සඳහා නව ආයෝජන මාධ්‍යයන් වෙත යොමුවීමේ අවශ්‍යතාව පෙර වර්ෂයන්ට සාපේක්ෂව ඉදිරි වර්ෂය තුළ ඉහළ වර්ධනයක් කරා යොමුවීමට අභ්‍යන්තර උපාය මාර්ගික සැලසුම් සකස්කර ඇත. අප විසින් සුපිලිපන් බව, විනිවිදභාවය සහ වගවීම සම්බන්ධ ඉහළ තත්වයන් අඛණ්ඩව සේවාවන් පවත්වාගෙන යන බවට තහවුරු කිරීම සඳහා ආයතනික පාලනයන් සවිමත් කිරීම අවශ්‍ය වූ අතර, එය අපගේ පරිවර්තනීය සේවාවන් චාරිකාවේ වැදගත් අංගයක් බවට පත් වී ඇත.

ඉදිරි වර්ෂ කිහිපය තුළ අප විසින් අපගේ අරමුණු සඳහා යෝග්‍ය වූ එමෙන්ම අපගේ සේවාවන්ට අදාල අනාගත පාරිසරික හා සමාජයීය දිශානතීන්ට ගැලපෙන ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක්, ක්‍රමවේදයන් සහ ක්‍රියාවලීන් රැසක් ස්ථාපනය කිරීමට 2026 වර්ෂය තුළ සැලසුම් කර ඇත. මෙකී වෙනස්වීම් සේවාවන් පරිවර්තනයට සහ තාක්ෂණික සේවාවන් මත පදනම් වූ නව සාමාන්‍ය ක්‍රියාවලියක් වෙත පිය නැගීමේදී ආයතනික සංවර්ධනයට 2026 වර්ෂය ඉමහත් ශක්තියක් වනු ඇත.

තාක්ෂණික හැකියාවන් උපයෝගී කර ගනිමින් සේවාලාභීන්ගේ වටිනාකම් ඉහළ නැංවීම සඳහා අපගේ වටපිටාව පරිවර්තනීය රාමුවකට පත් කළ යුතුව ඇත. ක්‍රමෝපාය නිසි පරිදි ගළපාගනිමින් වෙනස් වෙමින් පවතින සේවාලාභී අවශ්‍යතා සහ මෙහෙයුම් වටපිටාව වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා අපගේ ක්‍රමෝපාය නම්‍යශීලීවිය යුතු බව පැහැදිලි වේ.

ඒ අනුව, වැඩිදියුණු කරන ලද කාර්යසාධන නිරීක්ෂණ සමඟින්, ආයතනික ප්‍රයත්නයන් ඇගයීමට ලක් කරමින් සේවක සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා දියත් කරන ලද නව ව්‍යාපෘතීන් හමුවේ සමූහයේ මානව ක්‍රමෝපාය

එහි කාර්යසාධනය කෙරෙහි ප්‍රබල ලෙස ඉවහල් වන බව පැහැදිලි විය. පළාත් පාලන ආකෘති රාමුව සවිමත් කිරීම සඳහා අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඒවා වෙනස් වුනු පාරිසරික වටපිටාව සමඟ ගලපා ගනිමින් අපගේ මෙහෙයුම් කටයුතු තුළ ප්‍රබල සේවා චර්යාධර්ම සහ වගකීම් සපිරි වටපිටාවක් නිර්මාණය කිරීමට 2026 වර්ෂය සැලසුම් කර ඇත.

අසීමිත වූ අවශ්‍යතාවයන් සීමිත වූ සම්පත් ප්‍රමාණයකින් කාර්යක්ෂමව, ඵලදායීව හා අරපිරිමැස්මෙන් භාවිතා කිරිමට නිසි කළමනාකරණයක් සිදු කිරීමටත්, ඇස්තමේන්තුගත සියලුම ආදායම් අයකර ගැනීමටත්, ඒවා යොදවමින් බල ප්‍රදේශයේ සමාජ හා භෞතික සංවර්ධනය යන අංශ දෙකම එක හා සමානව වර්ධනය කිරීමටත් 2026 වර්ෂයේ දී දිඹුලාගල ප්‍රාදේශීය සභාව සැලසුම් කර ඇත.

පළාත් පාලන ආයතනයකින් ඉටුවිය යුතු මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල හා අනෙකුත් නීති රීති, චක්‍රලේඛ හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු උපදෙස් අනුගමනය කරමින් නෛතික රාමුව අතික්‍රමනය නොකරමින් වඩාත් ඵලදායී සේවාවක් සිදු කිරීමට අපහට හැකියාව ලැබී ඇති අතර, අභ්‍යන්තර විගණනය ශක්තිමත් කරමින් විගණන කළමනාකරණ කමිටු පවත්වමින් ඒ සඳහා වර්ෂය පුරාම මනා කැපකිරීමක් සිදුකිරීමට මාගේ කාර්ය මණ්ඩලයට හා ඒ සඳහා සහයෝගය ලබාදුන් ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට මා කෘතඥ වෙමි.

ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ නොමඳ සහය සියලු කාර්යන්හිදී නොමදව ලැබෙන අතර, ප්‍රාදේශීය සභාවකින් හුදු ජනතාවට ඉටුකල යුතු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරිමට මාගේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය ද මා අගය කොට සලකමි.

එන්.කේ.එස්.පී.කේ.නාරංගොඩ,<br>
ලේකම්,<br>
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.<br>
මනම්පිටිය.

## සභික තොරතුරු

| අ.අ | නම | තනතුර | පක්ෂය | දුරකථන අංකය | ලිපිනය |
|---|---|---|---|---|---|
| 01. | කේ.ආර්.ගයාන් චතුරංග මැතිතුමා | ගරු සභාපති | ජාතික ජන බලවේගය පක්ෂය | 071-9178836 | අංක. 02, ආයුර්වේද ගම්මානය, අරලගංවිල |
| 02. | කේ.ආර්.කොතලාවල මැතිතුමා | ගරු උප සභාපති | ජාතික ජන බලවේගය පක්ෂය | 078-7190044 | අංක 34,පිහිටිවැව, නුවරගල |
| 03. | ජයන්ත මාරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | පොදු ජන එක්සත් පෙරමුණ | 077-2757000 | අංක. 05, පන්සල පාර, මනම්පිටිය |
| 04. | ආර්.එම්.උපාලි රාජකරුණා මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | පොදු ජන එක්සත් පෙරමුණ | 072-0390640 | මහවැලි නිවාස, නුවරගල |
| 05. | යූ.ජී.සුජීව බන්දුසේන මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 077-4220005 | එල්. 01, නැගෙනහිර මනම්පිටිය, මනම්පිටිය |
| 06. | ජේ.එම්.රුවනි වාසනා මැතිණිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 078-4502616 | අංක 135,නව මිල්ලාන, දිඹුලාගල |
| 07. | ඒ.කේ.එල්.රත්නවිර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 078-3990538 | අංක 123, යාය 06, හංසයාපාලම, අරලගංවිල |
| 08. | එන්.කේ.ටී.එන්.ජයතිස්ස මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 076-9603200 | අංක68, බමුණාකොටුව, අරලගංවිල |
| 09. | ජී.ආර්.එන්.ප්‍රියදර්ශනි මැතිණිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 074-3562550 | අංක 34, මහදමන |
| 10. | ආර්.එම්.ප්‍රියන්ත රත්නායක මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 076-2135477 | අංක 388, ඇල්ලේවැව, පොළොන්නරුව |
| 11. | යූ.ඒ.පි.පි.ජී.අනුලා කාන්ති මැතිණිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 078-8680899 | අංක 140, බදනාගල, කළුකැලේ |
| 12. | එස්.බි.සමන්ත කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 072-4711411 | අංක 14, නවනගරය, සිරිපුර |
| 13. | ජී.ඒ.නන්දන සුගත් තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 076-6511297<br>076-7304730 | අංක 143, වරාපිටිය, රුහුණුගම |
| 14. | ඒ.වි.ඉන්දුසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 078-8041811 | අංක 08, කනිච්චාගල, රුහුණුගම |

| අ.අ | නම | තනතුර | පක්ෂය | දුරකථන අංකය | ලිපිනය |
|---|---|---|---|---|---|
| 15. | ආර්.එම්.උපාලි රත්නායක මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ජාතික ජන බලවේගය පක්ෂය | 071-8446452 | අංක 12, ඉහල වැව, දම්මින්න |
| 16. | පි.සුමිත් තිලකසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය | 077-9860857<br>072-9692273 | අංක 108, පහල යක්කුරේ, නුවරගල |
| 17. | කේ.බි.සමරසිරි ජයරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ පක්ෂය | 078-8516969<br>074-3633861 | අංක 70/A, මහදමන, ඇල්ලේවැව |
| 18. | ඒ.ජී.ධනවර්ධන මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 071-8962227<br>078-3677624 | අංක 194/A, ඉහල වැව, දිවුල්දමන |
| 19. | ආර්.එම්.සුනිල් රත්නායක මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 078-3107785 | අංක 172, කපුවත්ත, රුහුණුගම, අරලගංවිල |
| 20. | බි.එල්.සමන්ත උදයකුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 077-8728296 | අංක 193, මගුල්දමන, පැලැටියාව |
| 21. | බි.ඩික්සන් ඉන්ද්‍රජිත් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 076-8481874 | අංක 189, බෝගස්වැව, කාශ්‍යපපුර |
| 22. | ඩි.ඒ.මංජුලා මල්කාන්ති මැතිණිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 078-7731180<br>074-1272675 | අංක 306, නුවරගල, සිරිපුර |
| 23 | ඒ.එම්.චන්ද්‍රලතා ජයසිංහ මැතිණිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | සමගි ජන බලවේගය පක්ෂය | 070-2126845 | අංක 43, රත්මල්කණ්ඩිය, සිරිපුර |

# සංවිධාන ව්‍යුහය



ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව
ප්‍රාදේශීය මහ සභාව
අනු කමිටු
මුදල් කමිටුව
කාර්මික කමිටුව
පරිසර හා පහසුකම් කමිටුව
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
ගරු සභාපති
ගරු උප සභාපති
ලේකම්
සුභ සාධන සේවා
තාක්ෂණ සේවා
සෞඛ්‍ය සේවා
පොදු පරිපාලන
ආයුර්වේද
පුස්තකාලයාධිපති
පෙර පාසල් ගුරු
පුස්තකාල සහායක
පෙර පාසල් පාලිකා
පුස්තකාල කම්කරු
මාර්ග කම්කරු
තාක්ෂණ නිලධාරි
තාක්ෂණ සහායක
සෞඛ්‍ය කම්කරු
ප්‍රධාන කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
සහකාර ගිණුම් නිලධාරි
රියදුරු
ආදායම් පරිපාලක
කා:කා: ස :
කම්කරු
මුරකරු
වෛද්‍ය නිලධාරි
ඖෂධ සංයෝජක
ආයුර්වේද කම්කරු

# ආයතනික පාලන ප්‍රකාශය

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මහ සභාව අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හි වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය දිඹුලාගල ප්‍රාදේශීය සභාව කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ස්වයං උත්පාදන ආදායම වැඩිවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටි හා ක්‍රියාපිළිවෙත් නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

**මහසභාව**

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ගරු මහසභාව කාර්යසාධනයේ වගකිය යුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධතාවයන් කෙරෙහි වගකීමට බැඳී සිටින්නේය.

**වගකිම**

මූලික ප්‍රතිපත්තීන් හා උපයාශීලි අරමුණු සකස් කිරීමටත්, ඒවා ක්‍රියාවට නැංවීමටත්, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ගරු මහසභාව බැඳී සිටි. දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහා ද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි මහ සභාවයි.

**සංයුතිය**

ගරු සභාපති සහ ගරු උප සභාපති වරයකුගෙන් සමන්විත මහ සභාව 23 දෙනෙකුගෙන් යුක්ත වේ.

**මහසභා රැස්වීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක. 488/16 හි ඇතුළත් නියමයන්ට අනුව මහසභා රැස්වීම් 2025 වසරේ ජූනි මස සම්පාදනය කළ වාර්ෂික සිද්ධි කාලරාමුවට අනුකූලව මාසිකව පවත්වනු ලබයි. දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ උපයාශීලී ක්‍රමඋපායන් වාර්ෂික සකස්කරන අයවැය වාර්තාව සමඟ සියළු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධනය හා මූලධන වියදම් විමසීමට ලක්කිරීම මහසභා රැස්වීමේදී සිදු වේ. සෑම මහසභා රැස්වීමක්ම අති විශේෂ ගැසට් පත්‍ර අංක. 488/16 හි සඳහන් රීති ප්‍රකාරව පැවැත්වීමට සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛණ ගරු මහසභා සාමාජිකයන් හට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

## උපදේශක කාරකසභා හා එහි කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් අංක. 554/5 ප්‍රකාරව ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරවඋපදේශක කාරක සභාවල කාර්යභාරය.

1. කමිටු වල ප්‍රධාන කාර්යභාරය වන්නේ සභාවට උපදෙස් ලබා දීම හා නිර්දේශ ලබාදීම.
2. කමිටුවේ නිර්දේශ හා වාර්තා සාමාජිකයින් විසින් අත්සන් කර මහ සභාවට ඉදිරිපත් කිරීම.
3. මහ සභාව පැවැත්වීමට පෙර සෑම මසකටම එක් වතාවක් එක් කමිටු රැස්වීමක් පැවැත්වීම.
4. වාර්ෂික අයවැය සකස් කිරිම සඳහා යෝජනා හා නිර්දේශ ලබාදිම.
5. සෑම විටම බල ප්‍රදේශයේ සංවර්ධනය හා යහපාලනය සම්බන්ධ තීන්දු තීරණ ගැනීම.

## උපදේශක කාරකසභාවල බලතල හා විෂය සීමා

**මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටුව**

- ✓ ප්‍රාදේශීය සභා අරමුදල් ඇති කිරීම හා සම්බන්ධ කරුණු පිළිබද මහ සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ ප්‍රාදේශීය සභා අරමුදල් වියදම් කිරීම පිළිබඳ මහ සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ වාර්ෂික අයවැය ප්‍රතිපත්ති සැකසීම සදහා මහ සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා මහ සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ ඇස්තමේන්තු සලකා බැලීම හා නිර්දේශ ලබා දීම.
- ✓ සියලූම වවුචර් අනුමත කිරීම සදහා සලකා බැලීම හා මහ සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ ණය මුදලක් ලබා ගැනීම පිළිබද සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ වරිපනම් බදු පැනවීම පිළිබද සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ යම් බද්දක් හෝ ගාස්තුවක් නියම කිරීම සදහා සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ සභාව විසින් පවරන ලද බලතල හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

- ✓ බල ප්‍රදේශයේ ජනතාවගේ නිවාස අවශ්‍යතා හා ගැටළු හඳුනාගෙන විසදීම සඳහා සලකා බැලීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ✓ මහජන උපයෝගිතා හා සේවා පිළිබඳ සොයා බලා සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ වෙළඳ පොළවල් සම්බන්ධ නෛතික විධිවිධාන ඉටුකිරීමේදී සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ ජල සම්පාදන ක්‍රම පවත්වාගෙන යාමේදී ඇතිවන ගැටළු සකලා බලා සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ පෙර පාසල් පුස්තකාල සම්බන්ධ කරුණු සලකා බැලීම හා සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ සභාව විසින් පවරන ලද බලතල හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**කාර්මික සේවා කමිටුව**

- ✓ බල ප්‍රදේශයේ මංමාවත් අසල ඇති ගොඩනැගිලි හා මංමාවත් වලට සිදුවන අවහිරතා වැළැක්වීම සඳහා නිර්දේශ ලබාදීම.
- ✓ පළාත් පාලන ආයතන සතු ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳව නිර්දේශ ලබා දීම.
- ✓ මාර්ග ඉදිකිරීම හා සංවර්ධනය සඳහා සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ ප්‍රාදේශීය සභා පනතේ සඳහන් මංමාවත් වලට අදාල බලතල හා කාර්යයන් ඉටු කිරීමේදී සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ මාර්ග නඩත්තුව හා අළුත්වැඩියා කිරීම සම්බන්ධ සභාවට උපදෙස් හා නිර්දේශ ලබා දීම.
- ✓ මාර්ග පුළුල් කිරීම සහ ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ක්‍රියා කිරීමේ දී මූලිකත්වය ගෙන සභාවට උපදෙස් හා නිර්දේශ ලබා දීම.
- ✓ බලප්‍රදේශයේ සංවර්ධන කටයුතු පිළිබඳ සොයාබලා සභාවට වාර්ථා කිරීම.
- ✓ සභාව විසින් පවරන ලද බලතල හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**පරිසර හා පහසුකම් කමිටුව**

- ✓ මහජනතාවට වන පීඩා සම්බන්ධයෙන් යොමුකරන ලද පෙත්සම් හා පැමිණිලි සලකා බලා සභාවට නිර්දේශ ලබා දීම.
- ✓ පරිසර බලපත්‍ර ලබාදීමේ දී ගැටළු සහිත කර්මාන්ත හා නීතියට එකඟ නොවන කර්මාන්ත පිළිබඳව සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ පරිසර හානි හා බලපෑම් ලැබෙන පෙත්සම් හා පැමිණිලි විභාගකර සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ගැටළු සහගත අවස්ථාවල කමිටුව විසින් පරීක්ෂා කර බලා සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සම්බන්ධයෙන් නෛතික කටයුතු කිරීම සඳහා සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ බලප්‍රදේශයේ නිවැසියන් සඳහා අයත් වැසිකිළි හා ගොඩනැගිලි සම්බන්ධ ගැටළු නිරාකරණය සඳහා මැදිහත් වී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සභාවට නිර්දේශ ලබාදීම.
- ✓ බල ප්‍රදේශයේ මලාපවහන හා කසල ශෝධනය සම්බන්ධ ගැටළු සලකා බැලීම හා නිර්දේශ ලබාදීම.
- ✓ සභාව විසින් පවරන ලද බලතල හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

## කාර්ය මණ්ඩල විශ්ලේෂණය

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **01.** පොදු පරිපාලන | | | | |
| 1.1 | ලේකම් | 1 | - | - |
| 1.2 | සංවර්ධන නිලධාරි | 5 | 2 | 3 |
| 1.3 | සහකාර ගිණුම් නිලධාරි | 1 | 1 | - |
| 1.4 | කළමනාකරණ සේවා නිලධාරි | 5 | 6 | - |
| 1.5 | ආදායම් පරීක්ෂක | 1 | - | - |
| 1.6 | රියදුරු | 4 | 5 | - |
| 1.7 | මුරකරු | 2 | - | 2 |
| 1.8 | කාර්යාල කාර්ය සහායක | 1 | 5 | - |
| **02.** සෞඛ්‍ය සේවා | | | | |
| 2.1 | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 1 | 1 | - |
| 2.2 | ඖෂධ සංයෝජක | 1 | - | 1 |
| 2.3 | සෞඛ්‍ය කම්කරු | 10 | 11 | 2 |
| **03.** භෞතික සැලසුම් | | | | |
| 3.1 | තාක්ෂණ නිලධාරි | 1 | - | 1 |
| 3.2 | තාක්ෂණ සහායක | 1 | 1 | - |
| 3.3 | වැඩ අධීක්ෂක | 1 | - | 1 |
| 3.4 | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 1 | - | 1 |
| 3.5 | මාර්ග කම්කරු | 10 | 11 | - |
| 3.6 | කම්කරු | 16 | 20 | - |
| **04.** ජල සේවා | | | | |
| 4.1 | ජල පොම්ප ක්‍රියාකරු | 4 | 3 | 1 |
| 4.2 | ජල කම්කරු | - | 1 | - |
| **05.** මහජන උපයෝගිතා | | | | |
| 5.1 | විදුලි කාර්මික | 1 | - | 1 |
| 5.2 | ආදාහනාගාර සහායක | - | 3 | - |
| 5.3 | වාහන පිරිසිදු කරන්නා | - | 3 | |
| **06.** සුභසාධක | | | | |
| 6.1 | පුස්තකාලයාධිපති | 1 | - | 1 |
| 6.2 | පෙර පාසැල් ගුරු | 2 | - | 2 |
| 6.3 | පුස්තකාල සහායක | 2 | 1 | 1 |
| 6.4 | පුස්තකාල කම්කරු | - | 1 | - |
| එකතුව | | **72** | **75** | **17** |

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව
## අයවැය සාරාංශය - 2026

| විස්තරය | මුදල රු. | මුදල රු. |
|---|---|---|
| පුනරාවර්තන ආදායම | | 703,202,857.16 |
| **මුළු පුනරාවර්තන ආදායම** | | **703,202,857.16** |
| පුනරාවර්තන වියදම | 627,513,548.08 | |
| ක්ෂය වියදම | (9,750,000.00) | |
| **මුළු පුනරාවර්තන වියදම** | | **(617,763,548.08)** |
| | | |
| **ශේෂය (පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම)** | | **85,439,309.08** |
| රජයේ ප්‍රදාන | - | |
| <u>පුනරාවර්තන නොවන වියදම</u><br>ස්වයං උත්පාදන ආදායමෙන් | 85,439,000.00 | 85,439,000.00 |
| **ආදායම් අතිරික්තය / (ඌනතාවය)** | | **309.08** |

<u>**ක්ෂය වියදම**</u>

සභා අරමුදල වෙත මුදලින් ගලාඒමක් සහ මුදලින් ගලායාමක් සිදුනොවන බැවින් සභා අරමුදල් යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා වෙන්කළ හැකි වටිනාකමකි.

..........................
ගරු සභාපති

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව
## අයවැය සාරාංශය 2026

| අය ශීර්ෂය | අය විස්තරය | 2024 සත්‍ය ආදායම | 2025.09.30 දක්වා සත්‍ය ආදායම | 2025 ආදායම් ඇස්තමේන්තුව | 2026 ආදායම් ඇස්තමේන්තුව | වැය ශීර්ෂය | වැය විස්තරය | 2024 සත්‍ය වියදම | 2025.09.30 දක්වා සත්‍ය වියදම | 2025 වියදම් ඇස්තමේන්තුව | 2026 වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම් | | | | | | පුනරාවර්තන වියදම් | | | | | |
| 4100 | වරිපනම් හා බදු | 3,338,000 | 3,672,300 | 2,823,180 | 3,366,928 | 1000 | වැටුප් හා වේතන | 54,421,404 | 48,614,002 | 62,867,990 | 89,626,648 |
| 4200 | කුලී | 4,631,745 | 3,639,799 | 6,225,641 | 7,435,892 | 1100 | ගමන් ගාස්තු | 339,774 | 466,378 | 1,220,000 | 1,547,000 |
| 4300 | බලපත්‍ර ගාස්තු | 1,626,280 | 1,786,439 | 1,216,850 | 1,159,750 | 1200 | සැපයුම් | 26,571,404 | 22,034,885 | 31,234,218 | 466,798,450 |
| 4400 | සේවා ගාස්තු | 9,791,945 | 8,068,039 | 16,713,260 | 588,849,500 | 1300 | අළුත්වැඩියා හා නඩත්තු | 7,669,164 | 4,025,985 | 6,481,128 | 21,500,000 |
| 4500 | වරෙන්තු හා අධිභාර | 561,569 | 1,008,707 | 183,000 | 655,000 | 1400 | පරිපාලන වියදම් | 24,808,705 | 9,856,518 | 22,640,000 | 20,880,000 |
| 4600 | වෙනත් විකුණුම් | 59,798,932 | 47,127,925 | 35,131,856 | 42,122,227 | 1500 | සුභ සාධක ගෙවීම් | 190,675 | 1,392,850 | 1,100,000 | 7,550,000 |
| 4700 | පොලී ආදායම් | 2,530,685 | 59,538 | 1,750,000 | 1,650,000 | 1600 | විවිධ ගෙවීම් | 692,210 | 337,149 | 712,000 | 1,622,000 |
| 4800 | විවිධ ආදායම් | 38,275,952 | 76,234,182 | 22,260,000 | 25,500,000 | 1700 | වෙනත් | 4,346,939 | - | - | - |
| 4900 | ව්‍යාපෘති ආදායම් | - | - | - | - | 1850 | ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත පාඩු | - | - | - | - |
| 5100 | පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් | 43,036,892 | 23,615,891 | 58,458,940 | 30,400,560 | 1900 | මූල්‍ය පිරිවැය | - | - | - | 1,776,450 |
| **පුනරාවර්ථන ආදායම් එකතුව** | | **163,592,000** | **165,212,820** | **144,762,727** | **701,139,857** | **පුනරාවර්තන වියදම් එකතුව** | | **119,040,274** | **86,727,767** | **126,255,336** | **611,300,548** |
| 5200 | විස්තීර්ණ ආදායමේ හඳුනා ගන්නා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන | 25,073,604 | 13,811,765 | 20,000,000 | | 1800 | වර්ෂයේ ක්ෂය සඳහා වෙන් කිරීම් | 23,084,576 | - | 11,563,140 | 9,750,000 |
| 3400 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 565,159 | 629,621 | 1,570,000 | 2,063,000 | 3400 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 2,319,000 | 2,977,460 | 3,120,000 | 6,463,000 |
| 5500 | ආදායම් නොවන ලැබීම් | - | | 110,000 | - | | පුනරාවර්තන නොවන වියදම | - | 14,506,993 | 37,060,000 | 85,439,000 |
| | | | | - | - | වසර සඳහා අතිරික්තය (ඌණතාවය) | | - | - | 7,391 | 309 |
| **මුළු එකතුව** | | **189,230,764** | **179,654,206** | **166,442,727** | **703,202,857** | **මුළු එකතුව** | | **144,443,850** | **104,212,219** | **166,442,727** | **703,202,857** |

| අත්තිකාරම් ගිණුම් පිළිබඳ සීමාවන් | |
|---|---|
| | 2026 |
| **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම** | |
| උපරිම හර ශේෂ සීමාව | 3,445,939.00 |
| ලැබීමේ අවම සීමාව | 2,063,000.00 |
| වියදමෙහි උපරිම සීමාව | 6,463,000.00 |
| | |
| | |
| **පොදු ගබඩා අත්තිකාරම් ගිණුම** | |
| උපරිම හර ශේෂ සීමාව | 10,318,637.02 |
| උපරිම බැරකම් සීමාව | 466,798,450.00 |
| වියදමේ උපරිම සීමාව | 466,798,450.00 |

| ප්‍රාග්ධන ලැබීම් හා වියදම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| මූලධන ව්‍යාපෘති | | |
| | ප්‍රාග්ධන වියදම් ප්‍රදාන | ස්වයං උත්පාදන ආදායම් |
| | | |
| **01/01 දිනට විස්තීරණ ආදායමේ හදුනා නොගත් ප්‍රදාන** | - | - |
| වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම/වියදම | - | - |
| වර්ෂයේ විස්තීර්ණ ආදායම තුල හදුනාගත් ප්‍රදාන | - | - |
| 12/31 දිනට විස්තීර්ණ ආදායමේ හදුනා නොගත් ප්‍රදාන | - | - |

| පුනරාවර්තන නොවන වියදම් සාරාංශය ( ප්‍රාග්ධන වියදම් සාරාංශය) | | | | |
|---|---|---|---|---|
| වැඩ සටහන | විස්තරය | මූලධන ප්‍රදාන | ස්වයං උත්පාදන ආදායම් | එකතුව |
| 1 | පොදු පරිපාලනය | - | - | - |
| 2 | සේවා හා බදු | - | - | - |
| 3 | සෞඛ්‍ය සේවා | - | - | - |
| 4 | භෞතික සැලසුම් | - | - | 85,439,000.00 |
| 5 | ජල සැපයුම් | - | - | - |
| 6 | මහජන උපයෝගිතා | - | - | - |
| 7 | සුභ සාධක | - | - | - |
| 8 | කුණු කසල මෙහෙයවීම | - | - | - |
| එකතුව | | - | - | 85,439,000.00 |

# දිඹුලාගල ප්‍රාදේශීය සභාව

## ඇස්තමේන්තුගත ආදායම් සාරාංශය - 2026

| අය ශීර්ෂය | ආදායම් | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් | ජල සැපයුම් | මහජන උපයෝගිතා | සුභ සාධක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම් | | | | | | | | |
| 4100 | වරිපනම් හා බදු | 775,567.80 | 2,491,360.00 | - | - | 100,000.00 | - | **3,366,927.80** |
| | | | | | | | | |
| 4200 | කුලී | - | 300,000.00 | 1,800,000.00 | 200,000.00 | 5,135,892.16 | - | **7,435,892.16** |
| | | | | | | | | |
| 4300 | බලපත්‍ර ගාස්තු | 1,500.00 | 784,500.00 | - | - | 373,750.00 | - | **1,159,750.00** |
| | | | | | | | | |
| 4400 | සේවා ගාස්තු | 1,025,000.00 | 1,613,000.00 | 961,000.00 | 2,220,000.00 | 580,700,000.00 | 2,330,500.00 | **588,849,500.00** |
| | | | | | | | | |
| 4500 | වරෙන්තු සහ අධිභාර | - | - | - | 650,000.00 | - | 5,000.00 | **655,000.00** |
| | | | | | | | | |
| 4600 | වෙනත් විකුණුම් ආදායම් | - | 15,000.00 | - | 42,092,227.20 | - | 15,000.00 | **42,122,227.20** |
| | | | | | | | | |
| 4700 | පොලී ආදායම් | 1,650,000.00 | - | - | - | - | - | **1,650,000.00** |
| | | | | | | | | |
| 4800 | විවිධ ආදායම් | 25,500,000.00 | - | - | - | - | - | **25,500,000.00** |
| | | | | | | | | |
| 4900 | ව්‍යාපෘති ආදායම් | - | - | - | - | - | - | **-** |
| | | | | | | | | |
| 5100 | පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් | 14,961,074.40 | 3,406,932.00 | 1,466,978.40 | 8,335,303.20 | - | 2,230,272.00 | **30,400,560.00** |
| | | | | | | | | |
| පුනරාවර්තන ආදායම් එකතුව | | **43,913,142.20** | **8,610,792.00** | **4,227,978.40** | **53,497,530.40** | **586,309,642.16** | **4,580,772.00** | **701,139,857.16** |
| | | | | | | | | |
| 5200 | වර්ෂයේ ආදායම තුල හඳුනා ගන්නා ප්‍රාග්ධන ප්‍රදාන | | | | | | | **-** |
| | | | | | | | | |
| 5500 | ආදායම් නොවන ලැබීම් | | | | | | | **-** |
| | | | | | | | | |
| 3400 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 2,063,000.00 | | | | | | **2,063,000.00** |
| | | | | | | | | |
| මුළු ආදායම් එකතුව | | **45,976,142.20** | **8,610,792.00** | **4,227,978.40** | **53,497,530.40** | **586,309,642.16** | **4,580,772.00** | **703,202,857.16** |

# දිඹුලාගල ප්‍රාදේශීය සභාව

## ඇස්තමේන්තුගත වියදම් සාරාංශය - 2026

| වැය ශීර්ෂය | වැය විස්තරය | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් | ජල සැපයුම් | මහජන උපයෝගිතා | සුභ සාධක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | | | |
| 1000 | වැටුප් හා වේතන | 38,546,151.96 | 11,701,752.00 | 7,592,468.00 | 23,004,156.00 | 4,680,000.00 | 4,102,120.00 | **89,626,647.96** |
| 1100 | ගමන් ගාස්තු | 522,000.00 | 175,000.00 | 250,000.00 | 250,000.00 | 300,000.00 | 50,000.00 | **1,547,000.00** |
| 1200 | සැපයුම් | 11,990,080.00 | 5,325,490.00 | 12,163,880.00 | 14,294,320.00 | 422,154,680.00 | 870,000.00 | **466,798,450.00** |
| 1300 | අළුත්වැඩියා හා නඩත්තු | 5,000,000.00 | 800,000.00 | 6,000,000.00 | 6,700,000.00 | 1,000,000.00 | 2,000,000.00 | **21,500,000.00** |
| 1400 | පරිපාලන වියදම් | 5,698,000.00 | 282,000.00 | - | 13,344,000.00 | 634,000.00 | 922,000.00 | **20,880,000.00** |
| 1500 | සුභ සාධක ගෙවීම් | 300,000.00 | 1,350,000.00 | - | - | - | 5,900,000.00 | **7,550,000.00** |
| 1600 | විවිධ ගෙවීම් | 162,000.00 | 660,000.00 | 200,000.00 | 100,000.00 | - | 500,000.00 | **1,622,000.00** |
| 1700 | වෙනත් | - | - | - | - | - | | **-** |
| 1850 | ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත පාඩු | - | - | - | - | - | | **-** |
| 1900 | මූල්‍ය පිරිවැය | 1,776,450.12 | - | - | - | - | | **1,776,450.12** |
| පුනරාවර්තන වියදම් එකතුව | | **63,994,682.08** | **20,294,242.00** | **26,206,348.00** | **57,692,476.00** | **428,768,680.00** | **14,344,120.00** | **611,300,548.08** |
| 1800 | ක්ෂය සඳහා වෙන් කිරීම | 9,750,000.00 | | | | | | **9,750,000.00** |
| 3400 | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 6,463,000.00 | | | | | | **6,463,000.00** |
| මුළු වියදම් එකතුව | | **80,207,682.08** | **20,294,242.00** | **26,206,348.00** | **57,692,476.00** | **428,768,680.00** | **14,344,120.00** | **627,513,548.08** |


පොදු පරිපාලනය
හා කාර්ය
මණ්ඩල සේවා
සේවක
කළමනාකරණය
01. පොදු
පරිපාලනය
මූල්‍ය කටයුතු
අභ්‍යන්තර
විගණනය



# වැඩසටහන් අංක. 01

## පොදු පරිපාලන

උක්ත වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

- ✓ **ව්‍යාපෘති අංක 01**
  පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා
- ✓ **ව්‍යාපෘති අංක 02**
  මූල්‍ය කටයුතු
- ✓ **ව්‍යාපෘති අංක 03**
  අභ්‍යන්තර විගණනය
- ✓ **ව්‍යාපෘති අංක 04**
  සේවක කළමනාකරණය

### ව්‍යාපෘති අංක 01 - පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා

පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා යටතේ පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල, කාර්යය හා යුතුකම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටුකිරීමේදී පනවනු ලබන ප්‍රතිපත්ති හා තීරණ නිසියාකාරව, අප්‍රමාදව හා අර්ථවත් ලෙස ඉටුකරනු ලබන බවට තහවුරු කිරීමක් අපේක්ෂා කරනු ලබයි. එම අපේක්ෂාවන් මුදුන්පත් කරගැනීම සඳහා,

1. ගරු සභාපති, උප සභාපති හා ගරු මන්ත්‍රී මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා ලේකම් සේවාව සැපයීම.
2. සභාවේ රැස්වීම් සංවිධානය කිරීම, වාර්තා පවත්වාගෙන යාම හා තීරණ ක්‍රියාත්මක කිරීම.
3. සභාවේ ලිපිගොනු, වාර්තා හා වෙනත් ලිපිලේඛන සුරක්ෂිත කිරීම හා ලේඛනාගාරය පවත්වාගෙන යාම.
4. කාර්ය මණ්ඩල පාලනය, විශ්‍රාම වැටුප් හා අනෙකුත් පාලන කටයුතු සිදුකිරීම.
5. ප්‍රාදේශීය සභාවේ සියළුම පරිපාලනමය හා විධායක කාර්යයන් නියම කිරීම, විධිමත් කිරීම හා සමාලෝචනය කිරීම.
6. ප්‍රාදේශීය සභාවේ සෑම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් කටයුතු කිරීම.
7. ප්‍රාදේශීය සභාවේ දේපල ආරක්ෂාව හා පවරාගැනීමේ කටයුතු විධිමත් කිරීම.

### ව්‍යාපෘති අංක 02 - මූල්‍ය කටයුතු

